# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2260/47 - 2021 දෙසැම්බර් මස 29 වැනි බදාදා - 2021.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන සංශෝධිත නගර සභා ආඥාපනතේ 184(1)(1ආ)(අ)(ii) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරිය) 184(1)(1ආ)(අ)(ii) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාතේ ආණ්ඩුකාරවර ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ වන මම අම්බලන්ගොඩ නගර සභාවේ සභික වන ගංගේ සරත් ශ්‍රී ලාල් ද සිල්වා යන අය එම ධුරය දැරීම වහාම ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවමි.

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
පහල ඩික්සන් පරේ පිහිටි,
දකුණු පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 12-0323/1


1A - PG 5675 — 15 (2021/12)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## දකුණු පළාතේ පළාත් සභාව

### දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරය වන සංශෝධිත නගර සභා ආඥාපනතේ 184(1)(1අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ වන මම අම්බලන්ගොඩ නගර සභාවේ සභික ගංගේ සරත් ශ්‍රී ලාල් ද සිල්වා යන අය විසින් 255 වන අධිකාරය වන සංශෝධිත නගර සභා ආඥාපනතේ 184(1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකර ඇත්තේ ද යන්න පිළිබඳව මෙම දැන්වීමේ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරී සරෝජිනි කුසලා වීරවර්ධන මහත්මිය පත් කරමි.

මෙම නිලධාරිනියට මෙම පරීක්ෂණයට අදාළව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන කොමිෂන් බලතල ඇත්තේ ය.

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
පහල ඩික්සන් පරේ පිහිටි,
දකුණු පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 12-0323/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.